කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

**සමාජීය විද්‍යා පීඨය**

# භූගෝල විද්‍යාව
(නව නිර්දේශය)

**සිතියම් විද්‍යාව සහ භූගෝලීය තොරතුරු පද්ධතිය - GEOG 28224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "භූගෝල විද්‍යාඥයා සතු ප්‍රබල මෙවලමක් ලෙස සිතියම හඳුන්වා දිය හැකිය". මෙම ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

(ලකුණු 20)

02. (i) සිතියම්වල භාවිතාවන පරිමාණ ක්‍රම 03ක් නම් කර ඒවායේ පවතින වෙනස්කම් 03ක් පෙන්වා දෙන්න.

(ලකුණු 06)


(ii) රටක සංවර්ධන කටයුතුවලදී කුඩා හා විශාල පරිමාණවලින් නිර්මිත සිතියම්වල අවශ්‍යතාව සුදුසු උදාහරණ හතරක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 14)

03. (i) පහත A, B, C සහ D ලෙස දක්වා ඇති භූ ලක්ෂණ හඳුනාගෙන ඒවා නිවැරදිව නම් කරන්න.

(ලකුණු 02)

(A) (B) (C) (D)



(ii) භූ ලක්ෂණ සිතියමක හඳුනාගත හැකි ජලවහන ලක්ෂණ 03ක් දළ සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(iii) භූ ලක්ෂණ සිතියම් විවරණයේදී වැදගත්විය හැකි සාධක මොනවාදැයි දක්වා, ඒවා ඇසුරින් සිතියම් විශ්ලේෂණයක් සිදු කරන ආකාරය කෙටියෙන් දක්වන්න.

(ලකුණු 12)

04. (i) සිතියම් විද්‍යාවේදී භාවිතාවන පැතිකඩ වර්ග තුන නම්කර ඒවා නිර්මාණය කරගන්නා ආකාරය කටු සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) කිසියම් ප්‍රදේශයක සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී එම ප්‍රදේශයේ බෑවුම් විශ්ලේෂණය කිරීමේ වැදගත්කම සුදුසු උදාහරණ ඇසුරින් ගෙනහැර දක්වන්න.

(ලකුණු 10)

05. (i) සිතියමක් සහ පිඹුරුපතක් අතරැති වෙනස්කම් 05ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) ඔබ විසින් තොරාගත් එක් මිනුම් ක්‍රමයක් භාවිතා කරමින් නිවැරදිව බිම් මැනුමක් සිදුකර පිඹුරුපතක් සකස්කර ගන්නා ආකාරය සුදුසු දල රූපසටහනක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 10)

06. (i) භූගෝලීය තොරතුරු පද්ධතියෙහි ප්‍රධාන සංරචක කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) කෘෂිකාර්මික භූමි පරිහරණ සැලසුම් කිරීම සඳහා දුරස්ථ සංවේදනය යොදාගත හැකි අයුරු සාධක 05ක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

07. (i) සිතියම් ප්‍රක්ෂේපණ නිර්මාණයේදී සැලකිලිමත්විය යුතු සාධක 04ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ii) සර්ම-කලාපීය රටවල් සිතියම් ගත කිරීම සඳහා වඩාත් උචිත එක් ප්‍රක්ෂේපණ ක්‍රමයක් නම් කර, එය නිර්මාණය කරන ආකාරය දළ රූපසටහනක් සහිතව විස්තර කරන්න.

(ලකුණු 12)

08. මතු සඳහන් මාතෘකා දෙකක් (02) තෝරාගෙන ඒවාට කෙටි සටහන් ලියන්න.

(ලකුණු 20)

(i) ගුවන් ඡායාරූපකරණය
(ii) තේමා සිතියම්
(iii) ඛන්ඩාංක පද්ධති
(iv) අවකාශීය දත්ත

*****************************